# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

## සමාජීය විද්‍යා පීඨය

## දර්ශනය

## බටහිර දර්ශනය - PHIL 28224

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. බටහිර දර්ශනය විෂයයේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය පිළිබඳ දාර්ශනික අවධි ඇසුරෙන් පෙන්වා දෙන්න.

02. ආදි ග්‍රීක අවධියෙහි ලා 'විශ්වයේ ප්‍රභවය', බටහිර දර්ශනය සංවර්ධනය සඳහා බලපෑ ආකාරය විස්තාරණය කරන්න.

03. 'යථාර්ථය ප්‍රපංචවාදීත්වය ඉක්මවා පැවතෙයි' මෙම මතය ප්ලේටෝගේ ඥානවිභාගාත්මක කාරණා පදනම් කරගනිමින් විමසන්න.

04. මධ්‍යතනික දර්ශනයේ පසුබිම හා සුවිශේෂීතාවන් පරීක්ෂා කරන්න.

05. **එක්කෝ**

"බුද්ධිවාදී දාර්ශනික ගුරුකුලය බිහිවූයේ දීර්ඝකාලීනව පරිණාමය වූ දාර්ශනික ප්‍රවාදයකට ප්‍රතිවාදී පිළිතුරු සැපයීම සඳහාය." මෙම කියමනට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

**නැත්නම්**

බුද්ධිවාදී සහ අනුභූතිවාදී දාර්ශනික ධාරාවන් තුළ විද්‍යමාන වන ප්‍රායෝගික දාර්ශනික ලක්ෂණ පිළිබඳ තුලනාත්මක ඇගයීමක් කරන්න.

06. "මම සිතමි, එනිසා මම පවතිමි." යන රෙනේ ඩෙකාට්ගේ දර්ශනයේ පදනම, සමස්ත නූතන බටහිර දර්ශනයේ සංවර්ධනය සඳහා කේන්ද්‍රගත දාර්ශනික පදනම සකස්කිරීමට ඉවහල් වූ ආකාරය පෙන්වා දෙන්න.

07. දර්ශනයේ කොපර්නිකස් යැයි හඳුන්වන ඉම්මානුවෙල් කාන්ට්ගේ ඥානවිභාගීය කරුණු, බටහිර දර්ශනයේ සිදුකළ 'කොපර්නිකියානු විප්ලවය' කුමක්ද? විවේචනාත්මකව විමසීමට ලක්කරන්න.

08. සමකාලීන දර්ශනයේ සුවිශේෂී දාර්ශනික අවධීන් පිළිබඳ සංක්ෂිප්ත විග්‍රහයක යෙදෙන්න.

*******************************